සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**11 ශ්‍රේණිය** **දෙවන වාර පරීක්ෂණය - 2024** **87 S I,II**

නම: .......................................... **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I** කාලය : පැයයි

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1-40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 පිළිතුරුවලින් නිවරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් වරණයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

01) සන්නිවේදනය පිළිබඳ හැරල්ඩ් ඩී. ලැස්වෙල් අර්ථකථනයට අනුව 'යම් කිසිවක්' යනුවෙන් නිරූපණය කරන සන්නිවේදන මූලිකාංගය වන්නේ,
1. සන්නිවේදකයා ය. 2. ග්‍රාහකයා ය. 3. සංදේශය ය. 4. නාලිකාව ය.

02) සන්නිවේදන ක්‍රියාවලියක් අංග සම්පූර්ණ වන්නේ,
1. ග්‍රාහකයාගේ සහභාගිත්වය මගිනි. 2. ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය මගිනි.
3. බලපෑම මගිනි. 4. තාක්ෂණික මාධ්‍ය උපකරණ භාවිතය මගිනි.

03) සන්නිවේදන ස්වරූපයක් නොවන්නේ,
1. නිර්වාචික සන්නිවේදනය යි. 2. ශ්‍රව්‍ය සන්නිවේදනය යි.
3. ලිඛිත සන්නිවේදනය යි. 4. කණ්ඩායම් සන්නිවේදනය යි.

04) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය යනු,
1. ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි. 2. ස්ලයිඩ් ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි.
3. උරහිස් ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි. 4. ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි.

05) තම උප්පැන්න සහතිකය සුරක්ෂිතව දීර්ඝ කාලයක් ආරක්ෂා කර තබා ගැනීමට කළ හැකි උපක්‍රමය කුමක් ද?.
1. ලැමිනේටින් කිරීම. 2. අනුපිටපත් කිරීම. 3. රෝනියෝ කිරීම 4. මුද්‍රණය කිරීම.

06) වෘත්තීය මාධ්‍යවේදීන් ලෙස හඳුන්වනු ලබන්නේ,
1. ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ය. 2. මාණ්ඩලික මාධ්‍යවේදීන් ය.
3. පුරවැසි මාධ්‍යවේදීන් ය. 4. නිදහස් මාධ්‍යවේදීන් ය.

07 ) ආගමික හා සදාචාරාත්මක අංශ නියෝජනයට අදාළ වන්නේ,
1. සමාජ ප්‍රතිරූපය, රසඥතාවය හා ගැටුම් හා සාමය ය.
2. සමාජ ප්‍රතිරූපය,වැඩලෝකය හා රසඥතාවය ය.
3. සමාජ ප්‍රතිරූපය, ගැටුම් හා සාමය හා මානව ධර්මතා ය.
4. සමාජ ප්‍රතිරූපය, මානව හිමිකම් හා වගකීම් හා පවුල් සංස්ථාව ය.

08) නිශ්චල ඡායාරූපයක් ගැනීමට අත්‍යවශ්‍ය අංගයක් නොවන්නේ.
1. කැමරාව යි. 2. ආලෝකය යි.
3. ඡායාරූප ශිල්පියා යි. 4. නිර්මාණාත්මක කුසලතාව යි.

09) මතක කාඩ්පතක ගබඩා කළ හැකි ඡායාරූප ප්‍රමාණය තීරණය වන සාධක දෙක වන්නේ,
1. මතක කාඩ්පතේ ධාරිතාව හා රූප ගබඩා කිරීමට වැය වන ඉඩ ප්‍රමාණය යි.
2. විභේදන බලය හා මතක කාඩ්පතේ ධාරිතාවය යි.
3. ගබඩා කිරීමට වැයවන ඉඩ ප්‍රමාණය හා පවතින පික්සල් ප්‍රමාණය යි.
4. පික්සල් ප්‍රමාණය හා විභේදන බලය යි.

10) නිර්මාණශීලී භාෂාවක් යොදා ගනිමින් මානව හැඟීම්වලට ආමන්ත්‍රණය කරන ප්‍රවෘත්ති ප්‍රභේදය කුමක්ද?
1. දෘඪ පුවත්. 2. මෘදු පුවත්. 3. නිර්මාණාත්මක පුවත්. 4. ගවේෂණාත්මක පුවත්.

11) ජර්මන් හෝඩිය ලෝහ අකුරින් නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ,

1. ඇලොයිස් සෙනෙෆෙන්ඩර්ට ය.
2. අයිරා බෙල්ට ය.
3. ග්‍රේබියෙල් ස්කේද්ට ය.
4. ජොහැන්නස් ගුටෙන්බර්ග්ට ය.

12) විජය , මිහිර , සතර ආදී ළමා පුවත්පත්වල ප්‍රමාණ කාණ්ඩය වන්නේ,

1. බ්‍රොඩ්ෂීට් ය.
2. බර්ලින් ය.
3. ටැබ්ලොයිඩ් ය.
4. කොම්පැක්ට් ය.

13) ගුවන්විදුලි මාධ්‍ය හරහා යම් සිදුවීමක් මනසෙහි චිත්තරූප ඇඳෙන අයුරින් ඉදිරිපත් කිරීම.

1. පරිකල්පනය යි.
2. සංජානනය යි.
3. රූපාවලෝකනය යි.
4. රූප සංරචනය යි.

14) චාලි චැප්ලින් යනු,

1. තිර පිටපත් රචකයෙකි.
2. වැඩසටහන් නිෂ්පාදකයෙකි.
3. සිනමා රංගධරයෙකි.
4. ගායන ශිල්පියෙකි.

15) සමූහ සන්නිවේදනය සඳහා භාවිත කළ හැකි මාධ්‍ය උපකරණ ඇතුළත් වරණය තෝරන්න.

1. මයික්‍රෆෝන, විද්‍යුත් තැපෑල, කලු ලෑල්ල.
2. පිටු පෙරලනය, ස්ථාවර දුරකථනය, අන්තර්ජාලය.
3. ශබ්ද විකාශන යන්ත්‍ර, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය, මයික්‍රොෆෝන.
4. විද්‍යුත් තැපෑල, පේජරය, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ ය.

16) ගුරුතුමිය පැහැදිලි කර දුන් පාඩමට හොඳින් සවන් දුන් ශිෂ්‍යයෝ පසුව සටහන ලියා ගත්හ. මෙහි දී ශිෂ්‍යයන්ට උපකාරී වූ සන්නිවේදන ස්වරූප වන්නේ පිළිවෙලින්,

1. සමූහ සන්නිවේදනය හා වාචික සන්නිවේදනය යි.
2. ශ්‍රව්‍ය සන්නිවේදනය හා ලිඛිත සන්නිවේදනය යි.
3. සමූහ සන්නිවේදනය හා ලිඛිත සන්නිවේදනය යි.
4. ශ්‍රව්‍ය සන්නිවේදනය හා දෘශ්‍ය සන්නිවේදනය යි.

17) ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වය කෙරෙහි රජයේ සෘජු මැදිහත්වීමක් දක්නට ලැබෙන්නේ,

1. ආචාරධර්ම හඳුන්වා දීම මඟින් ය.
2. පුවත්පත් මණ්ඩලය විසින් මහජන පැමිණිලි භාරගැනීම මඟින් ය.
3. මාධ්‍යවේදීන් නිවාස, පරිගණක ආදී පහසුකම් ලබාදීම මඟින් ය.
4. විදේශීය වැඩසටහන් විකාශනයේ දී බදු පැනවීම මඟින් ය.

18) අඩු ආලෝක තත්වයක් යටතේ වුව ද පැහැදිලි ව ඡායාරූප ගැනීමට හැකියාව ලැබෙන්නේ.

1. රසායනික ඡායාරූපකරණයේදී ය.
2. ශ්‍රමායික කැමරා ඡායාරූපකරණයේ දී ය.
3. නිශ්චල ඡායාරූපකරණයේ දී ය.
4. අංකිත ඡායාරූපකරණයේදී ය.

19) ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම පිහිටුවීමෙන් අපේක්ෂා කරන්නේ,

1. රාජ්‍ය නිලධාරීන් අතින් සිදුවන මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට ය.
2. ප්‍රජාතන්ත්‍රවාදී ව ජීවත් වීමට අවශ්‍ය පසුබිම සලසා දීමට ය.
3. යහපත් ලෙස වෘත්තියක නියැලීමට අවශ්‍ය අවකාශ සලසා දීමට ය.
4. මානව හිමිකම් හා වගකීම් පිළිබඳ අවබෝධයක් ලබා දීමට ය.

20) මාධ්‍යවේදියෙකු වූ පාලිත වික්‍රමසිංහ මහතා ආර්ථික විද්‍යාව පිළිබඳ විද්වතුන් කිහිපදෙනෙකුගෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් ' වර්තමාන ආර්ථික අර්බුධය ' නමින් පුවත්පතකට ලිපියක් ලිව්වේ ය. ඒ සඳහා ඔහු යොදා ගත් තොරතුරු රැස් කිරීමේ ශිල්ප ක්‍රමය වන්නේ,

1. සම්මුඛ සාකච්ඡා ය.
2. බුද්ධි මණ්ඩල සාකච්ඡා ය.
3. සාමූහික සාකච්ඡා ය.
4. සංවාද ය.

21) පොතක් සම්බන්ධයෙන් දක්වා ඇති පහත ප්‍රකාශ අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. පිටකවරයකින් සමන්විත වීම.
2. එකට බැඳ තිබීම.
3. අන්තර්ගතය එකිනෙකට සමාන වීම.
4. පිටු 49 කට නොඅඩු වීම.

22) පුවත්පතක අන්තර්ගත වූ තොරතුරු පිළිබඳ ව ඉදිරිපත් වූ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- ප්‍රවෘත්ති හා විශේෂාංග ලිපි ඇතුළත් කිරීමෙන් පසු හිඩැස් පිරවීම සඳහා කාලානුරූපී තේමා ඔස්සේ නිර්මාණශීලිව ඉදිරිපත් කරයි.

B- සංවාද, දෙබස්, කවි පන්ති, වර්ණනා, විචාරයන් ඇතුළත් ලිපි ඉදිරිපත් කරයි.

C- විවිධ චරිත, ස්ථාන සඳහා සංකේතාත්මක රූප යොදා ගනිමින් නිර්මාණය කරයි.

ඉහත ප්‍රකාශවලට අදාළ ලිපි ආකෘතිය පිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.

1. කතු වැකි, තීරු ලිපි හා කාටූන් ය.
2. දැන්වීම්, විශේෂාංග හා තීරු ලිපි ය.
3. තීරු ලිපි, විශේෂාංග ලිපි හා කාටූන් ය.
4. තීරු ලිපි, විශේෂාංග ලිපි හා කතු වැකි ය.

23) වර්තමානයේ රූපවාහිනී මාධ්‍ය කෙරෙහි අනිසි බලපෑම් කිරීමට ප්‍රධාන වශයෙන් දායක වී සිටින්නේ,

1. රජය යි.
2. ග්‍රාහක ප්‍රජාව යි.
3. මාධ්‍ය හිමිකාරිත්වය යි.
4. ව්‍යාපාරික ප්‍රජාව යි.

24 ) කාන්තාවන් සවිබල ගැන්වීමේ අරමුණින් කාන්තා නිෂ්පාදන වෙළඳපළක් නාගරික ක්‍රීඩාංගනයෙහි පවත්වන ලදි. නිමල්ට ඒ පිළිබඳ ගුවන්විදුලි විකාශය තුළින් තොරතුරු ගෙන ඒම සඳහා භාවිත කළ හැකි වැඩසටහන් ආකෘතිය වන්නේ පහත ඒවායින් කුමක්ද?

1. කථා
2. සජීවී විස්තර ප්‍රචාර.
3. නිවේදන.
4. සම්මුඛ සාකච්ඡා.

25 ) නිමාලි විනාඩි 30ක කාලයක් තුළ රූපවාහිනී මාධ්‍ය මගින් විකාශනය කළ ක්‍රීඩා , සාහිත්‍ය, , ආගමික තොරතුරු සියල්ල අන්තර්ගත වූ වැඩසටහනක් නැරඹුවා ය. ඇය නැරඹූ රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදය වන්නේ,

1. වාර්තා වැඩසටහනක් ය.
2. සඟරාමය වැඩසටහනක් ය.
3. විචිත්‍රාංගමය වැඩසටහනක් ය.
4. සාකච්ඡාමය වැඩසටහනක් ය.

26) තොරතුරු වාර්තාකරණය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. උඩුකුරු පිරමීඩ සංකල්පය භාවිත කරයි.
2. විශාල පිරිසක් ඉලක්ක කර ගනිමින් සිදු කරයි.
3. වාර්තාවක මුල් ඡේදය මූල පාඨය ලෙස හඳුන්වයි.
4. ඡායාරූප ප්‍රවෘත්තියක වටිනාකම වැඩි කරයි.

27 ) ඡායාරූපකරණයේ දී පෞද්ගලික දෘෂ්ටිය එක් කිරීමට හැකි නොවන්නේ,

1. දේශපාලන රැස්වීම් අවස්ථාවක ඡායාරූප ගැනීමේ දී ය.
2. සම්මාන උළෙලක ඡායාරූප ගැනීමේ දී ය.
3. මංගල අවස්ථාවක ඡායාරූප ගැනීමේ දී ය.
4. ධාවන තරඟයක ඡායාරූප ගැනීමේ දී ය.

28 ) මේ වන විට රජයට අයත් ජනමාධ්‍ය ආයතන කිහිපයක් පහත දැක්වේ.

A- ලේක්හවුස් ආයතනය.
B- ලක්හඬ ගුවන්විදුලි සේවය.
C- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව.
D- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව.

ඉහත මාධ්‍ය ආයතන අතුරෙන් රජයට පවරා ගත් කොටස් හිමි සමාගම් වන්නේ,

1. A හා B ය.
2. B හා C ය.
3. C හා D ය.
4. A හා C ය.

29) පන්ති කාමර ඉගනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කිරීමට යෝග්‍ය මාධ්‍ය උපකරණ දැක්වෙන වරණය තෝරන්න.

1. දුරකථනය, අන්තර්ජාලය හා බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය.
2. ගණක යන්ත්‍රය, පැනල් පුවරුව හා දුරකථනය.
3. ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය, පිටු පෙරලනය හා චුම්බක පුවරුව.
4. කලු ලෑල්ල, අන්තර්ජාලය හා පේජරය.

30) අවිධිමත් සන්නිවේදනය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ප්‍රකාශ අතුරෙන් නිදොස් ප්‍රකාශය තෝරන්න.

1. න්‍යාය පත්‍රයකට අනුව ක්‍රියාත්මක වීම.
2. නිල ස්වභාවයක් පැවතීම.
3. සමාජ ජාලා ආදී තාක්ෂණික ක්‍රම ප්‍රබල ව යොදා ගැනීම.
4. වගකිව යුත්තෙක් සිටීම.

31) මව ගුවන්විදුලි ධර්ම දේශනයකට සවන් දෙමින් සිටින විට එහි හඬ එක්වරම ක්‍රියාවිරහිත විය. එහි දී ඇති වූ බාධක තත්වය වන්නේ.

1. මාධ්‍ය බාධක යි.
2. අර්ථ බාධක යි.
3. පාරිසරික බාධක යි.
4. ශ්‍රව්‍ය බාධක යි.

32) පන්ති කාමරයෙහි සිටින සිසුන් 45 දෙනාට ප්‍රශ්න පත්‍රයක් මුද්‍රණය කර ලබා දීමට ගුරුතුමියට අවශ්‍ය විය. ක්‍ෂණිකව හා අවම පිරිවැයකින් යුතුව එය ලබා දීමට සුදුසු මුද්‍රණ ක්‍රමය කුමක්ද ?

1. ඩිජිටල් අනුපිටපත් ක්‍රමය. 2. පරිගණක මුද්‍රණ ක්‍රමය.
3. ලේසර් මුද්‍රණ ක්‍රමය. 4. රෝනියෝ මුද්‍රණ ක්‍රමය.

33) හැම උද්වේගකර ආරංචියක් ම ප්‍රවෘත්තියක් බව අර්ථ කථනය කළේ මේ අය අතුරෙන් කවරෙක් ද?

1. චාර්ල්ස් ඇන්ඩර්සන් ඩානා. 2. පෝල්.ඩී.මැසෙනියර්.
3. මිල්ටන් බ්‍රෂ්. 4.ජෝන් මිල්ටන්.

34) රූපවාහිනී මාධ්‍යයට සාපේක්ෂව ගුවන්විදුලි මාධ්‍ය වඩාත් ප්‍රබල සුවිශේෂී වන්නේ,

1. භූගෝලීය බාධක විරල බැවිනි. 2. හඬ සම්ප්‍රේෂණ මාධ්‍යයක් බැවිනි.
3. අතිශය ක්ෂණික මාධ්‍යයක් වන බැවිනි. 4. අඩු වියදම් මාධ්‍යයක් වන බැවිනි.

35) "ඊයේ සිදු වූ මාරක රිය අනතුරින් පස් දෙනෙක් ජීවිතක්‍ෂයට පත් වූහ." ඉහත ප්‍රවෘත්ති රචනයේ ඇති දෝෂය කුමක් ද?

1. විස්තරාත්මක තොරතුරු ඇතුළත් වීම.
2. දීර්ඝ වැකි භාවිත කිරීම.
3. අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ රීති නිවරදි නොවීම.
4. අතීතය සඳහන් කරමින් පෙළ ආරම්භ කිරීම.

36) රූපවාහිනියෙහි විකාශනය වන ටෙලි නාට්‍යවල ලක්‍ෂණ කිහිපයක් පහත දැක්වේ.

P- කොටස් ගණනාවක් දැකිය හැකිය. Q-කොටසින් කොටස කථාවේ තේමාව වෙනස් වේ.
R- පටිගත කිරීම් කරන අතර විකාශනය කෙරේ. S-එක් කොටසකින් අවසන් වේ.

ඉහත ලක්‍ෂණවලට අදාළ නාට්‍ය ප්‍රභේදය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

1. මෙගා නාට්‍ය , විවිධාංගික නාට්‍ය , ප්‍රාසාංගික නාට්‍ය හා ඒකාංගික නාට්‍ය වේ.
2. ප්‍රාසාංගික නාට්‍ය , විවිධාංගික නාට්‍ය, මෙගා නාට්‍ය හා ඒකාංගික නාට්‍ය වේ.
3. ඒකාංගික නාට්‍ය , විවිධාංගික නාට්‍ය , ප්‍රාසාංගික නාට්‍ය හා මෙගා නාට්‍ය වේ.
4. ප්‍රාසාංගික නාට්‍ය , මෙගා නාට්‍ය, විවිධාංගික නාට්‍ය හා ඒකාංගික නාට්‍ය වේ.

37) ශ්‍රී ලංකාවේ පළ වන ග්‍රන්ථයකට ISBN අංකය ලබා දෙන්නේ,

1. ග්‍රන්ථ ප්‍රකාශන ආයතන මගින් ය.
2. ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් ය.
3. ප්‍රාදේශීය පුස්තකාල මණ්ඩලය මගින් ය.
4. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ය.


38) සේයාපටල කැමරාවකින් ගත් ඡායාරූපවල අනාවරණ ක්‍රියාවලියේ දී වෙනස් වී, සුදු පැහැති පැල්ලම් මතු වී විනාශ වී තිබිණි. ඊට ආසන්නතම හේතුව වීමට ඉඩ ඇත්තේ එම සේයාපටලය,

1. කල් ඉකුත් වීම යි. 2. තාක්‍ෂණික දෝෂයක් වීම යි.
3. පරිසරයට නොගැළපීම යි. 4. ආලෝකයට අනාවරණය වීම යි.

39) සංවෘත පරිපථ රූපවාහිනිජාල යොදා ගන්නේ,

1. ආරක්‍ෂක හා පිරික්සුම් කටයුතු සඳහා ය. 2. ප්‍රවෘත්ති හා වෙනත් වැඩසටහන් විකාශනය සඳහා ය.
3. විනෝදාස්වාද සම්පාදනය සඳහා ය. 4. භූගෝලීය වෙනස්වීම් හඳුනා ගැනීම සඳහා ය.

40 ) මෙහි දැක්වෙන්නේ රූප ප්‍රකාශන කිහිපයකි.




A B C D

P- A හා C පමණක් සංකේතාත්මක වේ. Q - B හා D පමණක් ලිඛිත වේ.
R- A,B,C,D යන සියල්ල ම නිර්වාචික වේ. S - A,B,C, D සියල්ල දෘශ්‍ය සංකේත වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් ,

1. P හා Q පමණක් සත්‍ය වේ. 2. Q හා R පමණක් සත්‍ය වේ.
3. Q හා S පමණක් සත්‍ය වේ. 4. P හා S පමණක් සත්‍ය වේ.

11 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 87 S II

නම: .............................................. **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II** **කාලය : දෙකයි**

- **පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමිවන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.**

01) සුප්‍රසිද්ධ හිමි නමක් වෙසක් පුන් පොහෝ දිනය නිමිති කරගෙන සුමධුර ධර්ම දේශනාවක් ගමේ විහාරස්ථානයේ දී පවත්වන ලදී.

I. ධර්ම දේශනාව පිළිබඳව ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීමට යොදා ගත් සන්නිවේදන ක්‍රම දෙකක් ලියන්න.

II. ධර්ම දේශනාව සිදු වන අවස්ථාව කුමන සන්නිවේදන වර්ගයට අයත්දැයි දක්වන්න.

III. මෙවැනි සන්නිවේදන අවස්ථාවක් තුළින් ඉටුවන මූලික සන්නිවේදන කාර්යය කුමක්ද?

IV. මෙම ධර්ම දේශකයාණන් වහන්සේගේ ධර්ම දේශනා මුහුණු පොතෙන් ද නැරඹිය හැකිය. ඒ සඳහා උපකාරී වන මාධ්‍ය පද්ධතිය නම් කරන්න.

V. ධර්ම දේශනය අතරතුර දිල්ෂාන් අංකිත කැමරාවක් මඟින් ඡායාරූප කිහිපයක් ද ගනු ලැබිණි. එම කැමරාව මඟින් ඡායාරූප ගැනීමේ වාසි දෙකක් ලියන්න.

VI. මෙම ධර්ම දේශනය පිළිබඳ ව පසු දින ජාතික පුවත්පතක ප්‍රවෘත්තියක් පළ කර තිබුණි.එහි මූල පාඨයේ ඇතුළත් කළ යුතු කරුණු දෙකක් ලියන්න.

VII. දේශනය කිරීමේ දී එක් වරම විදුලිය ඇණ හිටීම නිසා ශබ්ද විකාශන යන්ත්‍රය අක්‍රීය විය. මෙය සන්නිවේදනයේ කුමන බාධකයක් ද?

VIII. මෙම සන්නිවේදන අවස්ථාව තුළ සිටින සන්නිවේදක හා ග්‍රාහක භූමිකා නම් කරන්න.

IX. දේශකයන් වහන්සේ කළ ශාසනික සේවාව පිළිබඳ ව පුවත්පතක ලිපියක් පළ කර තිබුණි. පුවත්පත් අන්තර්ගතයට අනුව එම ලිපි ප්‍රභේදය අයත් වන ආකෘතිය ලියන්න.

X. ස්වාමීන්වහන්සේ ධර්ම දේශනය කිරීමේ දී පැමිණි සිටි දායක දායිකාවන් සමඟ ඇස් සම්බන්ධතාවය ද පවත්වා ගෙන යන ලදී. සන්නවේදන ක්‍රියාවලියට අනුව එම සංකල්පය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(ලකුණු 2×10= ලකුණු 20 )

02) පන්තිකාමර ඉගනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී විවිධ සන්නිවේදන වර්ග හා ස්වරූප භාවිතා වේ.

I ඉගනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත වන සන්නිවේදන වර්ග දෙකක් ලියන්න. (ලකුණු 01)

II. පාසල විධිමත් සන්නිවේදන ආයතනයක් බවට තහවුරු කෙරෙන සාධක දෙකක් දක්වන්න. (ලකුණු 02)

III. පාසලක් තුළ පහත සන්නිවේදන ස්වරූප ක්‍රියාත්මක වන ආකාරය උදාහරණ මඟින් ඉදිරිපත් කරන්න .
(a) ශ්‍රව්‍ය සන්නිවේදනය. (b) දෘශ්‍ය සන්නිවේදනය. (c)අවිධිමත් සන්නිවේදනය. (ලකුණු 03)

IV. ඔබගේ වාචික සන්නිවේදන නිපුණතා වර්ධනය කර ගැනීමට අනුගමනය කළ හැකි පියවර හතරක් පැහැදිලි කරන්න. ( ලකුණු 04)

03) ඡායාරූප ශිල්පය හදාරන ආධුනිකයෙකුට ශ්‍රමායික කැමරා භාවිතය වඩාත් සුදුසු වේ.

I. S.L.R කැමරාව භාවිතයේ වාසි දෙකක් ලියන්න. ( ලකුණු 01)

II. පහත කැමරා කාච වර්ග භාවිතයට ගත හැකි අවස්ථාවලට උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරන්න.
(a) දුර රූප කාච. ( b ) පුළුල් කෝණ කාච. ( ලකුණු 02)

III. පුවත්පතක ඇති ඡායාරූප ප්‍රභේද තුනක් යටතේ වර්ගීකරනය කළ හැකිය. ඒවා නම් කර කෙටියෙන් හඳුන්වන්න. ( ලකුණු 03)

IV. වර්තමාන පුවත්පත්වල ඡායාරූප බහුලව පළ කෙරේ. එසේ පළ කිරීමෙන් මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසි හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

04 ) පුවත්පත , ගුවන්විදුලිය , රූපවාහිනිය යන මාධ්‍ය ත්‍රිත්වය ම වර්තමානයේ නව මාධ්‍ය හරහා භාවිත කළ හැකිය.

I. එම සංකල්පය හඳුන්වන නම කුමක් ද? (ලකුණු 01 )
II. අන්තර්ජාල පාඨකයන් භාවිත කරන විද්‍යුත් පුවත්පත් ආකාර දෙක දක්වන්න. ( ලකුණු 02 )
III. ගුවන්විදුලි මාධ්‍යයට සාපෙක්ෂව රූපවාහිනි මාධ්‍යයේ ඇති දුබලතා තුනක් පැහැදිලි කරන්න.( ලකුණු 03)
IV. මාධ්‍ය සමාජය විසින් පාසලේ තොරතුරු ඇතුළත් කරමින් පුවත්පතක් නිර්මාණය කිරීමට තීරණය කරන ලදි. එහි දී අනුගමනය කළ යුතු මූලික පියවර හතරක් විස්තර කරන්න. ( ලකුණු 04 )

05) උදාරට එක්තරා මාධ්‍ය ආයතනයක ප්‍රාදේශීය මාධ්‍යවේදියෙකු ලෙස කටයුතු කිරීමට අවස්ථාව උදා විය.

I. තොරතුරු රැස්කරන්නෙකු ලෙස උදාර තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න. ( ලකුණු 01)
II. තොරතුරු වාර්තාකරණයේ දී ඔහුට යොදා ගත හැකි වාර්තාකරණ ක්‍රම දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)
III. විශ්වසනීයත්වය ඇති වන අයුරින් ප්‍රවෘත්ති රචනා කිරීමට උදාර සෑම විටම උත්සාහ කළේ ය. ඒ සඳහා ප්‍රවෘත්තිය තුළ අන්තර්ගතවිය යුතු ගුණාංග තුන නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)
IV. තොරතුරු රැස් කිරීමේ දී උදාර පිළිපැදිය යුතු ආචාරධර්ම හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

06) ජන මාධ්‍ය මඟින් සමාජීය , ආර්ථික , ආගමික හා සෞන්දර්යාත්මක අංශ නියෝජනය කරයි.

I. ජනමාධ්‍ය මඟින් නියෝජනය කරන සමාජීය පැතිකඩ දෙකක් නම් කරන්න. ( ලකුණු 01
II. ජනමාධ්‍ය මඟින් ආර්ථික අංශය නියෝජනය කළ හැකි ආකාර දෙකක් දක්වන්න. (ලකුණු 02)
III. අන්තර් වාර්ගික සහයෝගය ඇති කිරීම සඳහා ජනමාධ්‍යයකට මැදිහත් විය හැකි ආකාර තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 03)
IV. පරමාදර්ශී ශ්‍රී ලාංකික පුරවැසියෙකු ලෙස ඔබ ක්‍රියා කළ යුතු ආකාරය කරුණු හතරක් මඟින් විස්තර කරන්න. (ලකුණු 04)

07) සරෝජා පෞද්ගලික පුවත්පත් ආයතනයක සේවයට පැමිණි නවක කතුවරියෙකි. ඇයට ගැටලු මතු වූ විට සෑම විට ම නියෝජ්‍ය කර්තෘ සඳහා කථා කර විසඳුම් සපයා ගනියි.

I. ගැටළු විසඳාගැනීමට සරෝජා යොදා ගත් සන්නිවේදන වර්ගය නම් කරන්න. (ලකුණු 01)
II. එම සන්නිවේදන වර්ගයේ ලක්ෂණ දෙකක් දක්වන්න. (ලකුණු 02)
III. පුවත්පත් මාධ්‍ය ආයතනයක අභ්‍යන්තර ව්‍යුහය තුළ ඇති කතෘ මණ්ඩල අංශ හැර වෙනත් අංශ තුනක් පිළිබඳ ව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)
IV. සරෝජා සේවය කරන මාධ්‍ය ආයතනයේ ලක්ෂණ හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 04)